සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2045050

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல.353, கோட்டை வீதி, இராஜகிரிய. No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. எனது இல. My No. ED/03/15/02/2019

ඔබේ අංකය. உமது இல. Your No.

දිනය திகதி Date 2019.08.06

සුරාබදු චක්‍රලේඛ අංක :- 08 / 2019

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම),
සියලුම සුරාබදු කොමසාරිස්වරුන්,
සියලුම නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන්,
සියලුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්,
සියලුම සුරාබදු අධිකාරිවරුන්,
සියලුම සුරාබදු ස්ථානාධිපතිවරුන්,

**<u>සමත ගාස්තු ගෙවා අවසන් වූ සියලුම කාර්මික අපරාධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම</u>**

විගණකාධිපතිගේ 2019 මැයි මස 07 දිනැති "සුරාබදු තෑගි අරමුදල - 2018 අවසාන ගිණුම් පරීක්ෂාව" සම්බන්ධවූ විගණන විමසුම මගින්, සමත ගාස්තු ලැබීම් සහ ගෙවීම සම්බන්ධ වූ වියදම අතර වෙනසක් ඇති බව වාර්තා කර ඇත.

02. මෙයට ප්‍රධාන වශයෙන් බලපානු ලබන කරුණ වනුයේ, දෙපාර්තමේන්තු බැංකු ගිණුම් වෙත සමත ගාස්තුව තැන්පත් කල නමුත්, ඔබ විසින් අදාල වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත නියමිත කාලයට ලබා නොදීමයි. තවද, අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විගණන පරීක්ෂණ වලදීද 2016, 2017 සහ 2018 වර්ෂවලට අදාළ කාර්මික අපරාධ වාර්තා තවමත් ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර නොමැති බව නිරීක්ෂණය වී ඇත. මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් වන අතර සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අංක 3/2017 දරන 2017.03.12 දිනැති චක්‍රලේඛයෙන් දඩ මුදල් අය කිරීම වසරකට සීමාකර නියෝගයක් පනවා ඇති අවස්ථාවක සිදු වී ඇති අකාර්යක්ෂමතාවය හා ප්‍රමාදය නිසා තෑගි අරමුදල් ලැබිය යුතු නිලධාරීන්ට එය ලබා ගැනීමට නොහැකි වීම තුලින් අසාධාරණයක් සිදු වී ඇත.

03. ඒ අනුව, දෙපාර්තමේන්තුව වෙත සමත ගාස්තු ගෙවා අවසන් කරන ලද, සියලුම කාර්මික අපරාධ වාර්තා, ගෙවීම් කුවිතාන්සියේ පිටපතක්ද සහිතව දින 07ක් ඇතුලතදී ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කල යුතුය.

එච්.ජී. සුමනසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත - විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය